


**මාසයේ වැඩිම ඉල්ලුම ලද පොත**
සිංහල ජාතිය පාවාදීම
කේ එච් ජේ විජේදාස
**නවතම පිටපත් දැන් ලැබුණා**
ඩො 8.00

**සුජීව ප්‍රසන්නආරච්චිගේ**
දෙහදක කතාවක් ඩොලර් 8
වර්ෂා 1 ඩොලර් 9
වර්ෂා 2 ඩොලර් 9
උතුම් පැතුම් 1 ඩොලර් 8
උතුම් පැතුම් 2 ඩොලර් 8
උතුම් පැතුම් 3 ඩොලර් 9
උතුම් පැතුම් 4 ඩොලර් 8
කලුවර ඇයි විජිතයම මගේ ඩොලර් 8
චායා 1 ඩොලර් 8 චායා 2 ඩොලර් 8
මල්මිටියාවත ඩොලර් 8
සින්දූර් 3 ඩොලර් 8

කුමාර කරුණාරත්න ඕලු 5 ඩොලර් 8
කුමාර කරුනාරත්න තුෂාර සහ වසන්ති ඩොලර් 8
කුමාර කරුණාරත්න රතු රෝස ඩොලර් 8

**එඩ්වඩ් මල්වාරච්චි**
සුභා ඩොලර් 8
ප්‍රාර්ථනා ඩොලර් 8
සුබ ප්‍රාර්ථනා ඩොලර් 8

නිල්පාට ඇස් අනුරාදා නිල්මිණි ඩොලර් 8
කඩුල්ල අද්දර සකුන්තලා දමයන්ති ඩොලර් 8
ඉසුරු විජිතය විමල් තිලකරත්න ඩොලර් 8
සත්සයුර ජයසේන ජයකොඩි ඩො 8.00
තිසර සිහිනය නිව්ටන් ගුණසේකර ඩො 9.00
මයෙ නේත්නරා අජිත් ගලප්පත්ති ඩො 8.00
දෙන්නට දෙන්නා යසවර්ධන රුද්‍රිගු ඩො 8.00
සමුගනිමි පී ඇම් ජයතිලක ඩො 8.00
මහ මිහිඳු හිමි ජයසේන ජයකොඩි ඩො 9.00
මිදිගු නදිය නිව්ටන් ගුණසේකර ඩො 8.00
හන්තානේ කඳුමුදුන සිසාරා පී තේනුවර ඩො 8.00
නිසලා සහ විශාඛා ජයකොඩි සෙනෙවිරත්න ඩො 9.00
පොඩි මහත්තයා හද්‍රජී ම ජයතිලක ඩො 8.00
රන් තරුව ජයකොඩි සෙනෙවිරත්න ඩො 9.00
තුන් යාමයේ සිහිනය ජයන්ත මංගල රාජපක්ෂ ඩො 8
පාරුව පදින තුරු ඒ එම් කරුණාරත්න ඩො 8

**විවිධ**
සම්බුදු හිමි අසම සමයි පී ඇම් ජයතිලක ඩො 8.00
බුදු දහම හා ලෞකික ජීවිතය
මහාචාර්ය මීගොඩ පඤ්ඤාලෝක හිමි ඩො 8.00
බෞද්ධ දර්ශනය අත් සිරිරාහුල මහ නාහිමි ඩො 7.00
හුදකලාවේ අමාසුවය වැල් විනයවංශ හිමි ඩො 8
සැරියුත් හාමුදුරුවෝ ගයාන් චා විදානපතිරණ ඩො 9.00
වලගම්බා රජ්ජුරුවෝ එල්ලාවල මේදානන්ද හිමි ඩො 8.
බෙල්ලන ඤාණවිමල මහ නාහිමි
ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාර අනුනාහිමි ඩො 8.00
වැව්බැඳි රාජ්ජේ සවාරියක් එඩ්මන්ඩ් ජයසූරිය ඩො 8
සේරුවිල සුන්දරඅත්දැකීම් විමලසේන ජයලත් ඩො 7

මේ පොත් ද අප වෙතින් දැන් ලබාගත හැකි ය
**ජගත් ජේ එදිරිසිංහ ගේ**
අන්තර්ජාලයට පියවර ඩො 9
කන්ද උඩ මාලිගාව කෙටිකතා ඩො 6
සිසිරයේ පිපුණ මල කවි ඩො 5

සයුරෙන් එහා විනීතා
තලේරත්න නවකතා ඩො 8

තැපැල් හා දැවටුම් ගාස්තු එක් පොතක් සඳහා
ඩොලර් 2.00
සිංහ මාකටිං සර්විසස් නමට ලියන ලද මුදල් ඇනවුමක්/චෙක් පතක් එවා තැපෑලෙන් ලබාගන්න.

SINGHE
Marketing Services
7/438 Camp Road
Broadmeadows
Vic 3047
Tel :0413 829 370 03 9309 2427 (AH) Fax : 03 9309 2450




(පැහැදිලි කිරීමක් - සීයා ආවාද? උඹලා නැවාද? දෙවැකිය දොඩන බසේදී දිර්ඝ ස්වරය හ්‍රස්ව වි කියවෙන බව ඔබ දනිති. නවකතා නාට්‍ය ලිවීමේ ධී එහි සංවාද ලිවිය යුත්තේ දොඩන බසිනි. අපේ භාෂා රීතිය අනුව පදයක අග ඇති -අ- යන්න විවෘතව හැඬවිය නොහැක. මේ ගැටළුවට පිළියමක් වශයෙන් හ්‍රස්ව කොට හැඬවිය යුතු විවෘත ආ යන්න (දීර්ඝය) හැඳින්වීම සඳහා ඇලපිල්ලට හල් ලකුණක් යොදා -ා් - ලියමි. ඒ අනුව -සීයා් ආවා්ද? උඹලා් නැවා් ද? කියවිය යුත්තේ -ආ- ස්වරය විවෘත -අ- හඬ ඇතිවය. එනම් ඃ (විසර්ගය) යොදා ඇති හැටියටය්. මෙය අත්හදා බැලීමකි)

ගුරුන්නාන්සෙ මහත්තයය් මාය් පහුගිය සුමානෙ මලගේක ගියා නේ. ඒක නං අපූරු මල ගෙයක්. ඇත්තටම අලුත් අද්දැකීමක්. මට හිතෙන්නෙ ඔහේලත් ආස ඇති ඒ ගැන අහන්න. බස්නාඉර පලාතෙ කියනවා් නේ මරනෙ වැඩ ඉවර උනාම මල බතක් උයලා් කව්රුත් එක්ක කත සිරිතක්. මං හිතන්නෙ ඒක දකුණු පලාතෙ නෑ වෙන්ටෑ. මල බත නොකා යෑම අහිතවත් කොමක් හැටියටය් මෙහේ ගනං ගන්නෙ. ඒ හින්දා් අපි දෙන්නා් හතරැස් බොරුවක් කියලා් මල ගෙදර ඇත්තන්නෙං අවසර අරං ගෙදර එන්න හැරුනා්. මෙන්න බොලේ ජේම්ස් රාලහාමියත් අපේ පස්සෙං වැටුනා්. ඒ යකා මැරිච්ච කෙනාගෙ මාමා් ද බාප්පා් ද වෙනවා් දුර නෑ කමකිං.
ඉතිං කොහොමෙය් කට අරින්නේ.? අපි ගල් ගිලපාවා් වගේ කට පියාගෙන ඉක්මං ගමනින් ආවා්. වැහි බීරුමත් තිඋනු හින්දා් අපි ඔහොම මීටර් දෙසීයක් ආවෙත් නෑ.

-හාන්දුරුවො කීවෙ ඇත්ත.- රාලාමි කට ඇරියා.

-ංආ.. ඔව්.. ඇත්තනං තමයි.. ඒ උනාට මැරිච්ච ඇත්තන්නෙ වැරදි ගැන කතා නොකරන සිරිතකුත් තියෙනවා නේ... මං හිතුවා් වැස්ස අපට හිරිහැර කරාවිය කියලා්.. හැබැය් තව පැයක් යන්න කලිං කඩාගෙන වැටෙනවා්..- ගුරුන්නාන්සෙ මහත්තය වෙනත් තැටියක් වාදනය කරන්න පටන් ගත්තා. වෙනදා් ඔය වගේ වෙලාවට කට ඉස්සර කරන්නෙ මං.. එදා ගුරුන්නාන්සෙ මහත්තයා් පටස් ගාලා් කට ඇරියෙ මට කතා කරන්න එපා කියන එකට විත්තිය මට තේරුනා. ඒ මන්දා් මන්නේද කට ඇරියෙ නෑ.. රාලාමි නැවතුනා.

-හෙනං අප්පුහාමිලා් යන්න.. මං පොඩි මහත්තයලෑ ගෙදරට ගොඩ වෙලා එන්නං...- කියලා මිනිහා් පොඩි මහත්තයලෑ ගෙදර දිහාවට හැරුනා.

-මට හිතුනා් අර යකා ආවෙ අපි මොනවද ජෝනා ගැන කියන්නෙ කියලා් අහගන්ටය කියලා්. නැත්නං කවදාවත් අපිත් එක්ක ආව ගිය එකෙක්යැ. අප්පුහාමිට ඉස්සෙල්ලා මං කඩා පැන්නෙ ඒකය්..-
-මට තේරුනා.... මට තේරුනා.. ඒක හින්දා් තමය් මං කට ගෙදර තියලා ආපු ගානට හිටියෙ..-

එතන ඉඳලා ගුරුන්නාන්සෙ මහත්තයය් මාය් කතා කර කර ආවෙ මල ගෙදර ගැන. තමන්ට කොච්චර පාඩු උනත් බොරු වරුනාවට දිව නොනමන යතිවරයොත් අපේ රටේ ඉන්න බව මං දැන ගත්තෙ එදා. ඔය මැරිච්ච එකාට කියන්න වචනයක් සිංහල බාසාවෙ නං නෑ කියලය් මං හිතන්නෙ.. කුනුහබ්බ කියන්නත් බැරි හින්දා මං කොටිං කියන්නංකො -ජඩයා- කියලා්. ඔය ජඩයා මැරෙනකොට යාන්තං අව්රුදු හැට ලු. ඕකා මහා එපා කරපු වල් පෝටරයා. යාන්තං ඇටෙං පොත්තෙං තේරුනා විතරයි ගමේ ගෑනු කි දෙනෙකුට අතෝර කලා ද ඕකා.. දහ දෙනෙකුගෙ ඇඟිලි මදි වේවි ගනන කියන්න. වෙනෙකෙක් තියා හැට පැනපු ආත්තම්මලාටවත් ඉන්නැරියෙ නෑ ඕකා. උන්ට ලැජ්ජ හින්දා උං ඒවා යට ගහගෙන හිටියා.

දවසක් ද කෙල්ලෙක් ඕකාගෙ කම්මුල කෑවා. ඒක නං යකාගෙ කෑමක් .. මැරෙනකම්ම කැලල තිඋනා. හැබැය් ඉම්පස්සෙ කෙල්ලෙකුට පේන්න පාරෙවත් ගියෙ නැහැල්ලු. ඒකටත් එක්ක කසාද බැඳපු ගෑනු පස්සෙ තමය් පැන්නුවෙ.
ගමේ දුප්පත් මිනිහෙක්ගෙ කුකුල් කොටුවක්, එලු ගාලක්, බේරුනෙ නෑ ඔය නරියාගෙං.. තමනගෙ කිරි එලදෙං මරං කාපු වෙලාවෙ ගමේ මිනිහෙක් වස් කවි කියෝලා්, රිදී මකෝලා්, ඕකාට පිලි ගැහුවා්. කොහේ..? යක්කුන්ට ඒවා වදින්නෑ, උ‍ෟ උ‍ෟමය්.. මිනිස්සු දාල දෙපලක රා වික්කච්ච උං හිරේ ගියා ම මූ ඒ ගෙදර ලගින්න යනවා්. දහ බල්කං එකක් වත් අතෑරියෙ නෑ ඕකා..

පුදුමෙය් කියන්නෙ සිරියාවතී හාමිනේ මූට ලැබුනු එක. මහ මනුස්සය මූට බයටද කොහේ ද දෝනියන්දෑ මූට දුන්නා්. ඒ මනුස්සය මරුනෙත් හිතේ අමාරුවෙං.. හැබැය් දරුවො තුන්දෙනා නං සිරියාවතී හාමිනේ මල් වගේ හදා ගත්තා්.. ඇඬූ කඳුලෙන් ඉඳගෙනත් උන් තුන්දෙනා බෝදිසත්තයො තුන් දෙනෙක් වගේ හදාගත්තා්.. හොඳට ඉගෙන ගෙන හොඳ රස්සාවල් කරනවා් දං.. බොහොම ඇත. ගෙදර එන්නෙ මාස තුන හතරකට සැරයය්. හැබැය් ලෙදර ඉන්නෙ දවස් දෙකය් තුනය්.. අම්මත් එක්ක පන්සල් යනවා ආපු හැම දාම. ආපහු යනවා්.

මැරිච්ච මිනිස්සුංගෙ දොස් කියන එක සිරිතක් නූනත් එදා හාමුදුරුවංගෙ අන්සාසනාව නං.. කියලා වැඩක් නෑ.. එලකිරි වගේ.. ඇඟට පතට නොදැනෙන්න කෙලමෝලෙං ම ඇන්නා.

-අද අවසන් ගමන් යන ජෝම් මහත්තයා් මේ ගමේ විතරක් නෙවි අහල පහල ගං වලත් හොඳට ප්‍රසිද්දය්.. -මහා ආත්ම- කියන පද දෙක -මහත්- වෙලා තමය් මහතා කියන වචනය හැදිලා තියෙන්නෙ. ඒ වචනෙ ජෝම්මහත්තයට කොච්චර දුරට ගැලපෙනවා් ද කියලා මං කියන්න කැමති නෑ. මුං වපුරපු අයට මුඬුය් උඳු වපුරපු අයට උඳුය් ලැබෙන එක වලක්කන්න කාටවත් බෑ.. - ඔය විදියට අනුසාසනා කරපු හාමුදුරුවො අන්තිමට මෙහෙම කියාපි. -.. අද මෙතන ඉන්න හැම දෙනා ගම්ම මං ඉල්ලා හිටිනවා .. ඉතා කාරුනිකව ඉල්ලා හිටිනවා් මේ කිසිම කෙනෙක් ජෝම්මහත්තයා් අනුගමනය කරන්න එපා කියලා්-

මුලු සේනාවම එක පාරටම මහා හය්යෙං -සාදු- කියන කොට මැරිච්ච එකාට අහුනා් නං දැතින්ම පපුවට ගහ ගන්න එක සිකුරුය්.




ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාව අතර සිංහල සාහිත්‍යය පිළිබඳව ඇතිව තිබෙන පිබිදීම ආශ්වාදජනකය. මේ මොහොතේ දී මෙරට සිට සිංහලෙන් ලියන ලේඛක ලේඛිකාවන් දිරිමත් කිරීම සිය වගකීමක් ලෙස සන්නස සලකයි. සන්නස වාර්ෂික සාහිත්‍ය තරග මාලාව ඇරඹෙන්නේ ඒ සිතිවිල්ල නිසා ය.

තරග මාලාව කෙටිකතා සහ කාව්‍ය වශයෙන් දෙකොටසකින් යුක්ත වෙයි. සහභාගිවන විවිධ වයස් කාණ්ඩ වලට අයත් ලේඛක ලේඛිකාවනට අසාධාරණයක් නොවන සේ විවෘත හා කණිෂ්ඨ වශයෙන් අංශ දෙකක් යටතේ තරග පැවැත්වෙයි.

**විවෘත අංශය**
වයස් සීමාවකින් තොරව ඕනෑම ශ්‍රී ලාංකකයෙකුට විවෘත තරග වලට සහභාගි විය හැකි ය.

**කණිෂ්ඨ අංශය**
වයස අවුරුදු 18 ට අඩු තරගකරුවනට/තරගකාරියනට කණිෂ්ඨ අංශය යටතේ තරග වැදිය හැකි ය.

**කෙටි කතා (විවෘත/කණිෂ්ඨ)**

**පොදු කොන්දේසි**
1 කෙටි කතා සඳහා වචන සීමාවක් නැත.
2 තමන්ට කැමති තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති නිර්මාණ සංඛ්‍යාවක් එවන්නට අවසර ඇත.
4 කෙටිකතාව තමාතේම නිර්මාණයක් බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමග එවිය යුතුය.

**කාව්‍ය නිර්මාණ (විවෘත/කණිෂ්ඨ)**
**පොදු කොන්දේසි**
1 වචන සීමාවක් නැත
2 තමන්ගේ අභිමතය පරිදි සඳැස් හෝ නිසඳැස් නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති සංඛ්‍යාවක් නිර්මාණ ඉදිරිපත් කිරීමට අවසර ඇත.
4 නිර්මාණය තමන්ගේම බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමගම එවිය යුතුය.

**සියළුම අංශ සඳහා පොදු කොන්දේසි**
1 සෑම නිර්මාණයක්ම **පිටපත් තුනකින්** යුතුව එවිය යුතු ය.
2 තරගයට ඉදිරිපත් කරන නිර්මාණ මෙයට පෙර මුද්‍රිත හෝ වෙනත් ආකාරයකින් හෝ ප්‍රකාශිත ඒවා නොවිය යුතු ය.
3 තරගයට එවන නිර්මාණ නැවත ආපසු එවීමට හැකියාවක් නැති බව සළකන්න.
4 නිර්මාණ බාරගන්නා අවසාන දිනය **2006 අප්‍රේල් 30** වෙයි.
5 තරගය පිළිබඳ මතුවන ගැටළු වලදී සන්නස සංස්කාරකගේ තීරණය අවසන් තීරණය බව සළකන්න.

**නිර්මාණ එවිය යුතු ලිපිනය**
සන්නස වාර්ෂික සාහිත්‍ය තරගය 2006
**Sannasa**
PO Box 172 Reservoir
Vic 3073
Australia

නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය
ලක් හඬ
FM 97
**සෑම ඉරිදාවකම**
දහවල් 10.00 සිට 12.00 දක්වා
**ඔබේ හඬ - ලක් හඬ**